museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2024 මාර්තු

**MMCA ශ්‍රී ලංකා ‘දෙවැනි වෙළුම’ එළි දක්වයි**

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) සිය ප්‍රථම පර්යේෂණ ප්‍රකාශනය වන ‘දෙවැනි වෙළුම: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ එළිදක්වයි. ශාර්මිණී පෙරේයිරා සහ කෞමදී ජයවීර විසින් සංස්කරණය කළ මෙම ප්‍රකාශනය, මහනුවර වටපුළුව නිවාස යෝජනා ක්‍රමයේ (1958) සංදර්භය තුළ වාස්තු විද්‍යාඥ මිනෙට් ද සිල්වාගේ (1918–1998) පෙරළිකාර නිර්මාණ කර්තව්‍යය ගවේෂණය කරයි.

‘දෙවැනි වෙළුම’ MMCA ශ්‍රී ලංකාහි වත්මන් ප්‍රදර්ශනය වන ‘අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ හා අනුයන අතර, පාඨකයන්ට ප්‍රාථමික පර්යේෂණ හා මීට පෙර ප්‍රකාශිත නොවූ ආකයිව් ද්‍රව්‍යවලට අසමසම ප්‍රවේශයක් ලබාදෙයි. ද සිල්වාගේ දූරදර්ශී ප්‍රවේශය පිළිබඳව වටිනා දැනුම සපයන ‘is this an architectural documentary?’ (2023) නම් ඉරුෂි තෙන්නකෝන්, සුමේධ කැලේගම, හා සුමුදු අතුකෝරල යන සමකාලීන කලාකරුවන් විසින් කළ සජීවීකෘත වාර්තා චිත්‍රපටයෙහි පිටපත, මෙම ප්‍රකාශනයේ කැපී පෙනෙන කොටසකි.

ප්‍රකාශනයේ මිල රුපියල් 15,000ක් වන අතර එහි පෙරේයිරා විසින් කළ විශේෂයෙන් පැවරුණු රචනාවක් ද ඇතුළත් ය. වාස්තු විද්‍යාඥයින් වන කැලේගම හා අතුකෝරල විසින් සූක්ෂමව සකස් කර ඇති වටපුළුව නිවාස යෝජනා ක්‍රමය සඳහා ද සිල්වා නිර්මාණය කළ නිවාස ප්‍රරූපණ පහක මැනුම් සැලසුම්වලින් එය අනුපූරණය වේ. ‘Experiments in Modern Regional Architecture in Ceylon 1950 to 1960’ (1965–1966) නම් ද සිල්වාගේ මුඛ්‍ය රචනාවෙහි විශේෂ අතිරේකයක් මෙම පර්යේෂණ ප්‍රයත්නයට ගැඹුරක් මෙන් ම ඓතිහාසික සංදර්භයක් එකතු කරයි.

තිරසාරත්වය සහ දේශීය නියැලීම යන ද සිල්වාගේ ඌරුවට අනුකූලව, ‘දෙවැනි වෙළුම’ දේශීයව සපයාගත හැකි කඩදාසි තොගවලින් මුද්‍රණය කර ඇත්තේ, පාරිසරික බලපෑම අවම කරමින් සහ උපායදක්ෂකම පිළිබඳ ඇගේ උරුමයට ගෞරවය දක්වමින් ය. මීට අමතරව, ද සිල්වාගේ අභාවයෙන් පසු ප්‍රකාශිත ‘The Life and Work of an Asian Woman Architect Vol. 1’ (1998) යන ස්වයං චරිතාපදානය අනුගමනය කිරීමෙන් මෙම ප්‍රකාශනය ඇයගේ ආකයිව්කරණ ප්‍රයත්නය දීර්ඝ කරයි. මෙම පොත සමඟ, පොත් මුද්‍රණය කිරීමේදී කපා හැරූ කඩදාසිවලින් MMCA ශ්‍රී ලංකා විසින් සටහන් පොත් නිර්මාණය කර ඇති අතර, ඒවා ආලේප නොකළ ආර්ට් කඩදාසි, ඕෆ්සෙට් කඩදාසි, හා

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

ආලේපිත ආර්ට් කඩදාසි යන කඩදාසි වර්ග තුනකින් ලබා ගත හැක. පොත් තුනක කට්ටලයක් රු. 2,000කට ද තනි සටහන් පොතක් රු. 800කට ද විකිණේ.

බැංගලෝර් පදනම් කරගත් නියා තණ්ඩපානි විසින් නිර්මාණ සැලසුම් කළ සහ ශ්‍රී ලංකාවේ ගුණරත්න ඕෆ්සෙට් ලිමිටඩ් විසින් මුද්‍රණය කරන ලද 'දෙවැනි වෙළුම', අධ්‍යාපනය සහ සංස්කෘතික සංරක්ෂණය සඳහා MMCA ශ්‍රී ලංකා කරන කැපවීම විදහා දක්වයි. ප්‍රකාශනය සහ ආශ්‍රිත සටහන් පොත්වල අලෙවියෙන් ලැබෙන ආදායම, ද සිල්වාගේ කාර්යය පිළිබඳව සිදුවෙමින් පවතින පර්යේෂණයවලට හා MMCA ශ්‍රී ලංකාහි මහජන වැඩසටහන්වලට සහාය වෙයි. 'දෙවැනි වෙළුම: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' MMCA ශ්‍රී ලංකාහි මෙන් ම

facebook.com/mmcasrilanka හරහා ඔවුන්ගේ ෆේස්බුක් පිටුව තුළින් හෝ instagram.com/mmcasrilanka/ හරහා ඉන්ස්ටග්‍රෑම් පිටුව තුළින් දැන් මිලදී ගත හැක.

MMCA ශ්‍රී ලංකා විසින් 'දෙවැනි වෙළුමෙහි' දෙමළ හා සිංහල පරිවර්තන 2024 අප්‍රේල් මස එළිදක්වනු ලැබේ. පුළුල් ප්‍රවේශය සහ දැනුම බෙදා ගැනීම දිරිමත් කරමින්, ඒවා කෞතුකාගාරයේ වෙබ් අඩවියේ නොමිලේ බාගත හැකි ආකාරයෙන් බෙදා හැරෙනු ඇත.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස් කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටු කරගත් මුලපිරීමකි.